# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2385/12 - 2024 මැයි මස 21 වැනි අඟහරුවාදා - 2024.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 94/47 (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් :-

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ''ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාලය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ ''ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාල භූමිය'' සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

1A - G 41966 — 09 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාල භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දේවමැද්දේ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1236 පානව ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, සූරියගොඩ ග්‍රාමයේ පිහිටි, හෙක්ටයාර් 0.0344ක් විශාලත්වයෙන් යුතු සර්වේයර් ජනරාල්ගේ 2010 මාර්තු මස 25 දිනැති අංක 2539 දරන අවසාන ගම් පිඹුරේ දේවාලේලගහේන නමැති ඉඩමේ කැබලි අංක ''2'' වශයෙන් නිරූපිත පහත පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :

**කැබලි අංක 2**

*උතුරට* : ගොන්නව ගම් මායිම ;
*නැගෙනහිරට* : කැබලි අංක 1 ;
*දකුණට* : කැබලි අංක 1 ;
*බටහිරට* : කැබලි අංක 1 සහ ගොන්නව ගම් මායිම.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දේවමැද්දේ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 1236 පානව ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, ගොන්නව ග්‍රාමයේ පිහිටි, හෙක්ටයාර් 0.6924ක් විශාලත්වයෙන් යුතු සර්වේයර් ජනරාල්ගේ 2010 මාර්තු මස 25 දිනැති අංක 2540 දරන අවසාන ගම් පිඹුරේ දේවාලේලගහේන නමැති ඉඩමේ කැබලි අංක ''4'' වශයෙන් නිරූපිත පහත පැරිදි මායිම් වූ බිම් ප්‍රදේශය :

**කැබලි අංක 4**

*උතුරට* : කැබලි අංක 1 ;
*නැගෙනහිරට* : කැබලි අංක 1 සහ සූරියගොඩ ගම් මායිම ;
*දකුණට* : සූරියගොඩ ගම් මායිම සහ කැබලි අංක 1 ;
*බටහිරට* : කැබලි අංක 1.

EOG 05 - 0155/1

---

එල්.ඩී.බී 94/47 (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින්,

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ''තංගල්ල ඓතිහාසික හේනකඩුව රජමහා විහාරය'' යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ ''තංගල්ල ඓතිහාසික හේනකඩුව රජමහා විහාරය'' සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 16 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***තංගල්ල ඓතිහාසික හේනකඩුව රජමහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගිරුවා පත්තු සුළු කොට්ඨාසයේ, මැඩිල්ල (අ. ග. පි. 315) ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ 2016 නොවැම්බර් මස 09 දිනැති අංක H/TNG/2016/400 දරන අනුරේඛනයේ කැබලි අංක ''ඒ'' දරන මැදකැටිගොඩවත්ත *හෙවත්* වෙලේවත්ත හේනේකඩුව සුධර්ශනාරාම පන්සල්වත්ත නමැති ඉඩමේ හෙක්ටයාර් 1.2126ක් විශාලත්වයෙන් යුක්ත පහත පරිදි මායිම් වූ බිම් ප්‍රදේශය ;

**කැබලි අංක ''ඒ '' මැදකැටිගොඩවත්ත *හෙවත්* වෙලේවත්ත හේනේකඩුව සුධර්ශනාරාම පන්සලේවත්ත**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කුඹුර (හේනේකඩුව රජමහා විහාරය), කැබලි අංක බී සහ මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක බී, මාර්ගය සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) ; |
| *දකුණට* | : | මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ ගෙවතු (කාන්ති කරුණාරත්න සහ තවත් අය) ; |
| *බටහිරට* | : | ගෙවතු (කාන්ති කරුණාරත්න සහ තවත් අය) කුඹුර (හේනේකඩුව රජමහා විහාරය) සහ කැබලි අංක බී. |

EOG 05 - 0155/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.